ඉතින් guys අපි මේ pdf එකෙන් ටිකක් technical පැත්ත ගැන කතා කරනවා. අපිට trade කරන්න ඕනෙ වෙන additional දේවල්. හැබැයි හොඳ confirmations ගන්න පුලුවන් මේකෙන්. ඉතින් අපි මුහුදට බැහැලම බලමු මේක කොයි වගේද කියලා.

1) FIBONACCI
2) OPTIMAL TRADE ENTRY
3) PREMIUM AND DISCOUNT
4) DIVERGENCE

## FIBONACCI

•Market එක මොනයම් හෝ දිශාවකට run වෙලා ඊට පස්සෙ pull back එකක් දෙනවා. එතකොට මේ pull back එකෙන් අපි හරියටම entry එකක් ගන්නකොට මේ tool එක use කරන්න පුලුවන්.

• Fib tool එක use කරන්න කලින් අපි ඒකෙ තියෙන value ටික හරියට හදාගන්න ඕනෙ.මම පහලින් දාන්නම් value ටික. ඔයාලත් ඒ value ටික හදාගන්න fib tool එකේ.

1.5

1

0.650

0.618

0.5

0.236

0

-0.27

-0.618


-0.790

•Market එක Up trend එකක,එහෙම නැත්තන් buy side යනවනම් අපි fib tool එක අඳින්න ඕනෙ Higher Low එකේ ඉඳන්

Higher High එක දක්වා. එතකොට market එක pull back එකක් දෙනකොට අපිට හරියටම බලාගන්න පුලුවන් කොතනින් market එක turn වෙන්න පුලුවන්ද කියල.මතක තියාගන්න මේක technically විතරයි. ඒක අපිට support එකක් කරගන්න පුලුවන් අපේ analys වලට.



•Market එක Down trend එකක,එහෙම නැත්තන් sell side යනවනම් අපි fib tool එක අඳින්න ඕනෙ Lower High එකේ ඉඳන් Lower Low එක දක්වා. එතකොට market එක pull back එකක් දෙනකොට අපිට හරියටම බලාගන්න පුළුවන් කොතනින් market එක turn වෙන්න පුළුවන්ද කියල.මතක තියාගන්න මේක technically විතරයි. ඒක අපිට support එකක් කරගන්න පුළුවන් අපේ analys වලට.




•මෙතනදි 0.618 සහ 0.650 zone එක තමයි අපි golden pocket එක කියල කියන්නේ. එතනට market එක ආවට පස්සෙ අපිට entries ගන්න පුලුවන්. එතනින් market එක හැරෙන්න තියෙන සම්භාවිතාව 90%ක් වගේ තියෙනවා. හැබැයි මෙතනදි මම අයෙත් කියනව ඔයාලට. මේක technically විතරයි. Fundamentally මොනව හරි reasons නිසා මේක fail වෙන්න පුලුවන්. ඒක නිසා හොඳට fundamental side එකත් බලල entries ගන්න අමතක කරන්න එපා.

•ඔයාලට කැමතිනම් fib tool එකේ background එකත් colour කරගන්න පුලුවන්. නැත්තන් colour නොකරගෙන ඉන්නත් පුලුවන්.ඒත් එක්කම values ටික right side එකට දාගන්න. ඒක ඔයාලට ගොඩක් පහසු වෙයි. ඒක මගෙ personal මතය විතරයි.

# PREMIUM AND DISCOUNT

• මෙතනදි 0.5 සහ 1 කියන zone එක අපි හඳුන්වන්නෙ Discount zone එක කියලා. ඒ වගේම 0.5 ත් 0 ත් අතර zone එක අපි හඳුන්වන්නේ Premium zone එක කියලා.

•අපි කිසිම වෙලාවක premium zone එකේදි entries ගන්නෙ නෑ.
•මේ premium zone එකේදි ඔයාල entries දැක්කොත් එහෙම ඒකෙන් entries ගන්න යන්න එපා. ඒක ටිකක් risky දෙයක්.
•ඉවසගෙන ඉඳල Discount zone එකට market එක ආවහම ඔයාලගෙ entry එක ගන්න පුලුවන්.



# DIVERGENCE

•අපි මෙතනදි භාවිතා කරන්නේ RSI Indicator එක. දිග වචනෙන් කිව්වොත් Relative Strength Index. මේක ඔයාලට ඕනම market එකකට apply කරන්න පුලුවන්.
•Market එක ගමන් කරන දිශාවට විරුද්ධව indicator එක ගමන් කරොත් එතනදි divergence එකක් හැදෙනවා.
•Bullish divergence එකකින් පස්සෙ market එක buy වීමක් සහ Bearish divergence එකකට පස්සෙ market එක sell වීමකුත් අපිට බලාගන්න පුලුවන්.


•මෙතනදි RSI indicator එකේ levels තියෙනවා.30 සහ 70 levels දෙක.

•මෙතනදි 70 ට වඩා indicator එක buy උනොත් අපි කියනවා market එක over bought වෙලා කියලා.


•ඒ වගේම 30 ට වඩා indicator එක sell උනොත් අපි කියනවා market එක over sold වෙලා කියලා.


•Indicator එක Over bought උන වෙලාවට හරි Over sold උන වෙලාවට හරි divergence එකක් හැදුවොත් ඒක valid වෙන්න තියෙන probability එක වැඩියි.


Over Bought




Over Sold


Bullish Divergence


Hidden Bullish Divergence



Bearish Divergence



Hidden Bearish Divergence



•මේ තියෙන්නෙ live market එකකින් ගත්ත example එකක් ඔයාලට පෙන්නන්න. මෙතනදි හැදිල තියෙන්නෙ Bearish Divergence එකක්.

•ඉතින් ඔන්න ඔය විදියට තමයි මේ pdf එක ඉවර වෙන්නේ. මම හිතනවා ඔයාලට තේරුනා කියල මම කියල දීල තියෙන දේවල්.එහෙනම් ඊලඟ එකෙන් හම්බෙමු.

All rights reserved©.
ORGA AUKLAND (PVT) LTD